රු 5000.00
207907
2014/06/19

# මාගධී ව්‍යාඛ්‍යාන සම්ප්‍රදාය හා එයට අයත් සාහිත්‍යය

## (සූත්‍ර පිටකයේ ප්‍රධාන නිකාය ග්‍රන්ථයන්ට අයත් අට්ඨකථා ඇසුරින් කරනු ලබන විමර්ශනයක්)

නම : වඩුරව මුදියන්සේලාගේ දේශප්‍රිය ගුණසේන

ශාස්ත්‍රවේදී (විශේෂ) පාලි, ප්‍රථම පන්තිය, ශ්‍රී ජයවර්ධනපුර, 1996.
ශාස්ත්‍රපති, (බෞද්ධ අධ්‍යයන) බෞද්ධ හා පාලි, 1998.
ශාස්ත්‍රපති (වාග් විද්‍යාව) කැලණිය, 2003.
ශාස්ත්‍රපති (පාලි - පර්යේෂණ) ශ්‍රී ජයවර්ධනපුර, 2003.
Dip in Ed., කොළඹ, 1998.
ප්‍රාචීන පණ්ඩිත, ප්‍රාචීන භාෂොපකාර සමාගම, 1999.

අධ්‍යයනාංශය : පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

ලේඛනාරූඪ අංකය : GS/PhD/PA/3188/07

විෂයය : පාලි

වර්ෂය : 2012 දෙසැම්බර්. 31

Library - USJP
207907

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ දර්ශනසූරි උපාධි පරීක්ෂණය සඳහා
පාලි විෂයය යටතේ ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය

207907

# සාර සංක්ෂේපය

**'මාගධී ව්‍යාඛ්‍යාන සම්ප්‍රදාය හා එයට අයත් සාහිත්‍යය' (සූත්‍ර පිටකයේ ප්‍රධාන නිකාය ග්‍රන්ථයන්ට අයත් අට්ඨකථා ඇසුරින් කරනු ලබන විමර්ශනයක්)** යන ප්‍රස්තුතය සාධනය කිරීමට පරිච්ඡේද සයක් හඳුනා ගැනේ.

පළමු පරිච්ඡේයෙහි ගැටලුව, ගැටලුව හැඳින්වීම, පර්යේෂණයේ අරමුණ, පර්යේෂණ ක්‍රමවේදය, පර්යේෂණයට අදාළ පූර්ව අධ්‍යයන හා ප්‍රධාන මූලාශ්‍රය හඳුනා ගැනීම අන්තර්ගත වේ. ප්‍රස්තුතයට අදාළ විනය පිටකයේ ග්‍රන්ථ පහ, සූත්‍ර පිටකයේ සූත්‍ර දේශනා, මහානිද්දෙස පාළිය, පටිසම්භිදාමග්ගප්පකරණය, උදානපාළිය, නෙත්තිප්පකරණය, පෙටකොපදෙසය, දීඝනිකාය හා සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථාව යන ප්‍රධාන මූලාශ්‍රය ප්‍රභේදයන් හඳුන්වා දී ඇත.

දෙවැනි පරිච්ඡේදය ථෙරවාද සම්ප්‍රදාය ලෙස හඳුනා ගෙන උපශීර්ෂ හතරක් යටතේ විමර්ශනය කෙරේ. ථෙරවාද සම්ප්‍රදායයේ මාධ්‍යය භාෂාව, සකාය නිරුක්ති, මාගධී නිරුක්ති හා පාලි නිරුක්ති, පාලි නිරුක්ති කථනය හා පාලි භාෂාවෙහි ප්‍රභවය හෙවත් ජන්ම භූමිය යන උපශීර්ෂයන් යටතේ කරුණු දක්වේ. ථෙරවාද සම්ප්‍රදාය හඳුනා ගැනීමත්, එහි මාධ්‍යය භාෂාව වූ පාළියත්, පාළි යන්නෙහි නිරුක්තිය විමර්ශනය කිරීමත්, පාළියේ ප්‍රභවය හා ජන්ම භූමිය පිළිබඳව පෙර අපරදිග විද්වතුන්ගේ මතවාද හා ඒවායෙහි පවතින විශ්වසනීයත්වය පරීක්ෂා කිරීමත් මේ පරිච්ඡේදයේදී සිදු කොට ඇත.

ත්‍රිපිටකයෙහි බුද්ධභාෂිත ව්‍යාඛ්‍යාන ලක්ෂණ යන්න තෙවැනි පරිච්ඡේදයේ මාතෘකාව යි. මෙයින් මාගධී ව්‍යාඛ්‍යාන අර්ථ විවරණය, මාගධී ව්‍යාඛ්‍යාන සම්ප්‍රදාය, ත්‍රිපිටක පාළියේ ව්‍යාඛ්‍යාන යෙදුම්, අර්ථ විවරණ ක්‍රමයෙහි ප්‍රභවය, බුද්ධභාෂිත ධර්මාර්ථ විග්‍රහයෙහි සුවිශේෂ ලක්ෂණ, ශ්‍රී මුඛ පාළිය රැක ගත් භාණක පරපුර, බුද්ධකාලීන ධර්මාර්ථ ව්‍යාඛ්‍යාන භාෂක මහතෙරවරු යන උපශීර්ෂ හඳුනා ගෙන මූලාශ්‍රය විමර්ශනය කොට තිබේ. ත්‍රිපිටක පාළිය තුළ විද්‍යමාන *සංඛිත්ත දේසනා, විත්ථාර දෙසනා* හා *සංඛිත්ත විත්ථාර දෙසනා* ප්‍රභේදයන්ට අනුව මාගධී ව්‍යාඛ්‍යාන කථනයේ ආදී කර්තෘ බුදුන් වහන්සේ බවත්, සම්මුඛ ශ්‍රාවකවරුන්ගෙන් ආරම්භ ව ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ පොත්ථකසංගීතිය තෙක් පැවති

භාණක පරපුර විසින්, සම්ප්‍රදායක් ලෙස වර්ධනය කර ඇති අයුරුත් විමර්ශනාත්මක ව සාකච්ඡා කෙරේ.

සිවුවැනි පරිච්ඡේදය නිරුක්තිකථන සම්ප්‍රදාය ලෙස නම් කොට උපශීර්ෂ හතරක් යටතේ මූලාශ්‍රය අධ්‍යයනය කෙරේ. නිරුක්තිකථන ක්‍රමයෙහි පසුබිම, ත්‍රිපිටකාගත නිර්වචන ක්‍රමය, යාස්ක ආචාර්යවරයාගේ නිරුක්ති භාවිතයේ විධික්‍රම හා නිරුක්තිකථන ක්‍රම තුලනය වශයෙන් යොදා ගෙන තිබේ. උක්ත උපශීර්ෂ යටතේ නිරුක්තිකථන සම්ප්‍රදායයේ ඓතිහාසික සම්බන්ධයත්, යාස්ක ආචාර්යවරයාගේ යාස්ක නිරුක්තීන්හි විධික්‍රම හා නිරුක්තිකථන ක්‍රමයත් තුලනය කොට සාකච්ඡා කෙරේ. ත්‍රිපිටක පාළියේ ඇතුළත් නිර්වචන ක්‍රමයත්, ඒවායෙහි ස්වභාවයත් විමර්ශනය කිරීමේ දී, බුදුරදුන් මාගධී ව්‍යාඛ්‍යාන සම්ප්‍රදායයේ ආදි කර්තෘ ලෙස හඳුනා ගැනීම සුවිශේෂ කරුණකි.

අට්ඨකථාවන්හි ව්‍යාඛ්‍යාන ලක්ෂණ නමින් පස්වැනි පරිච්ඡේදය හැඳින්වේ. මෙහි දී අට්ඨකථාවන්ට මූලාශ්‍රය වූ හෙළටුවා ග්‍රන්ථ, අට්ඨකථා රචිත කාලය හා ආචාර්යවරු, අට්ඨකථා සංවණ්ණනා ක්‍රම, අට්ඨකථාවන්හි විද්‍යමාන වෛයාකරණික මූලාශ්‍රමය තොරතුරු, වෛයාකරණික පාරිභාෂික වාග් ප්‍රයෝග යැයි උපශීර්ෂ පහක් යටතේ පර්යේෂණයේ යෙදුණි. අට්ඨකථාවන්ට මූලාශ්‍රය වූයේ මහාඅට්ඨකථා, මහාපච්චරිය අට්ඨකථා හා කුරුන්දි අට්ඨකථා යන සීහළට්ඨකථා තුන බවත්, බුද්ධඝෝස, ධම්මපාල, බුද්ධදත්ත, මහානාම හා උපසේන යන භාරතීය ආචාර්යවරුන් පාළිමුත්තක අට්ඨකථාවන් අභිසංස්කරණය කළ බවත්, බුද්ධඝොස තෙරුන් හා ධම්මපාල තෙරුන් එහි ලා ප්‍රමුඛ වූ බවත් විමර්ශනය වේ. බුද්ධඝොස තෙරුන් මාගධී ව්‍යාඛ්‍යාන සම්ප්‍රදායයේ පැවති *'අත්ථ හා ඛ්‍යඤ්ජන පද* පදනම් කොට ගෙන සංගීතිකාරක තෙරවරුන් හඳුන්වා දුන් අංගයන් ද එක් කොට, පශ්චාත් ත්‍රිපිටක ග්‍රන්ථ අතර නෙත්තිප්පකරණයෙහි දැක්වෙන *අත්ථපද* සය හා *ඛ්‍යඤ්ජනපද* සය ගෙන අට්ඨකථා සංවර්ණනා කොට තිබේ. එහි දී එවක පැවති භාරතීය ව්‍යාකරණ ග්‍රන්ථයන්ගේ ආලෝකය ලබා ගත් අයුරු ද විමර්ශනය කරන ලදී.

සය වැනි පරිච්ඡේදය, ධර්මාර්ථ විවරණයෙහි ලා අර්ථ ව්‍යාඛ්‍යානයන්හි විශ්වසනීයත්වය යැයි නම් කොට ඇත. උක්ත ප්‍රස්තුතය සාධනය කිරීමේ දී දීඝනිකාය පාළිය හා එම අට්ඨකථාව අතර දක්නට ඇති වෙනස්කම්, මාගධියෙහි දී තිබෙන කරුණුවලට වඩා එකතු වී ඇති අලුත් කරුණු දෙසනා පාළියෙන් බැහැර උදාහරණ කථා ගෙන හැර දැක්වීම,

දෙසනා පාළියේ නො එන උපමා මගින් කරුණු දැක්වීම, දීඝනිකාය පාළියේ නො එන ගාථාවන් මගින් විවරණ දැක්වීම, පුද්ගල නාමයන්ට අදාළ පුරාවෘත්ත ගෙන හැර දැක්වීම, පෙළෙහි දී තිබෙන කරුණු අට්ඨකථාවේ විශාල කොට දැක්වීම, ධර්මාර්ථ විවරණයෙහි ලා අර්ථ ව්‍යාඛ්‍යානකරු දක්වා ඇති උපහාසාත්මක කථා, භාණකවරුන් අතර පැවති මතභේද ඇතුළත් කිරීම, පෙළ හා අට්ඨකථාවෙහි පාඨාන්තරයන්හි පවතින අපපාඨ හා සදොස් පාඨ හඳුනා ගැනීම වශයෙන් උපශීර්ෂ දහයක් යටතේ අධ්‍යයනය කෙළෙමි.

දීඝනිකාය පාළියේ සීලක්ඛන්ධ වග්ගයේ සූත්‍ර දේශනා, එම අට්ඨකථාව වූ සුමංගලවිලාසිනිය සමග තුලනය කිරීමෙන් උක්ත ප්‍රස්තුත හඳුනා ගෙන තිබේ. එම විමර්ශනය තුළින් ප්‍රකට වන්නේ ධර්මාර්ථ විවරණයෙහි ලා අර්ථ ව්‍යාඛ්‍යානයන්හි විශ්වසනීයත්වය තහවුරු වන බව යි.

පරිච්ඡේද සයකින් යුක්ත ව ප්‍රස්තුතයට අදාළ මූලාශ්‍රය විමර්ශනය කිරීමෙන් ඒ ඒ පරිච්ඡේද තුළින් තහවුරු කෙරෙන තොරතුරු පදනම් කොට සමස්තය තුළින් ප්‍රකට වන නිගමනය ඉදිරිපත් කෙරේ. ඒ අනුව පෙළෙහි තිබෙන ධර්ම කරුණු විවරණය කළ ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයන්හි යම් යම් අසදෘශතා ඇතත්, සමස්තය පිළිබඳව විශ්වාස කළ හැකි බව නිගමනය වේ.

# පටුන


| | | |
|---|---|---|
| මාතෘකා පිටුව | | i |
| ප්‍රකාශය | | ii |
| උපදේශකවරුන්ගේ නිර්දේශය | | iii |
| පිදුම | | iv |
| උපකාරානුස්මෘති | | v |
| සාරසංක්ෂේපය | | vi-viii |
| හැකුළුම් | | ix-xv |
| පටුන | | xvi-xix |
| **01 පරිච්ඡේදය** | | |
| **මූලාශ්‍රය හැඳින්වීම** | **(01 - 52 ඡේද)** | **01 - 29** |
| ගැටලුව | (01) | |
| ගැටලුව හැඳින්වීම | (02-08) | |
| පර්යේෂණයේ අරමුණ | (09-13) | |
| පර්යේෂණ ක්‍රමවේදය | (14-15) | |
| පර්යේෂණයට අදාළ පූර්ව අධ්‍යයන | (16-36) | |
| ප්‍රධාන මූලාශ්‍රය හඳුනාගැනීම | | |
| විනය පිටකයේ ග්‍රන්ථ පහ | (37-40) | |
| සූත්‍ර පිටකයේ සූත්‍ර දේශනා | (41-42) | |
| මහානිද්දෙස පාළිය | (43-45) | |
| පටිසම්භිදාමග්ගප්පකරණය | (46) | |
| උදානපාළිය | (47) | |
| නෙත්තිප්පකරණය | (48) | |
| පෙටකොපදෙසය | (49) | |
| දීඝනිකාය | (50-51) | |
| සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා | (52) | |

02 පරිච්ඡේදය

**ථෙරවාද සම්ප්‍රදායයේ මාධ්‍යය භාවිතය** (53-188 ඡේද) 30 - 96

I. ථෙරවාද සම්ප්‍රදායයේ මාධ්‍යය භාෂාව (53-76)

II. සකාය නිරුක්ති, මාගධී නිරුක්ති, පාලි නිරුක්ති (77-81)

III. පාලි නිරුක්ති කථනය (82-141)

IV. පාලි භාෂාවෙහි ප්‍රභවය හෙවත් ජන්ම භූමිය (142-188)

03 පරිච්ඡේදය

**ත්‍රිපිටකයෙහි බුද්ධභාෂිත ව්‍යාඛ්‍යාන ලක්ෂණ** (189-306 ඡේද) 97-197

I. මාගධී ව්‍යාඛ්‍යාන අර්ථ විවරණය (189-192)

II. මාගධී ව්‍යාඛ්‍යාන සම්ප්‍රදාය (193-236)

III. ත්‍රිපිටක පාළියේ ව්‍යාඛ්‍යාන යෙදුම් (237-243)

IV. අර්ථ විවරණ ක්‍රමයෙහි ප්‍රභවය (244-247)

V. බුද්ධභාෂිත ධර්මාර්ථ විග්‍රහයෙහි සුවිශේෂී ලක්ෂණ (248-253)

VI. ශ්‍රීමුඛ පාලිය රැකගත් භාණක පරපුර (254-279)

VII. බුද්ධකාලීන ධර්මාර්ථ ව්‍යාඛ්‍යාන භාෂක මහතෙරවරු (280-306)

04 පරිච්ඡේදය

**නිරුක්ති කථන සම්ප්‍රදාය** (307-347 ඡේද) 198-233

I. නිරුක්තිකථන ක්‍රමයෙහි පසුබිම (307-309)

II. ත්‍රිපිටකාගත නිර්වචන ක්‍රමය (310-324)

III. යාස්ක ආචාර්යවරයාගේ නිරුක්ති භාවිතයේ විධික්‍රම (325-330)

IV. නිරුක්තිකථන ක්‍රම තුලනය (331-347)

05 පරිච්ඡේදය


අට්ඨකථාවන්හි ව්‍යාඛ්‍යාන ලක්ෂණ (348-460 ඡේද) 234-316

I. අට්ඨකථාවන්ට මූලාශ්‍රය වූ හෙළටුවා ග්‍රන්ථ (348-367)

II. අට්ඨකථා රචිත කාලය හා ආචාර්යවරු (368-381)

III. අට්ඨකථා සංවණ්ණනා ක්‍රම (382-425)

IV. අට්ඨකථාවන්හි විද්‍යමාන වෛයාකරණික මූලාශ්‍රමය තොරතුරු (426-438)

V. වෛයාකරණික පාරිභාෂික වාග් ප්‍රයෝග (439-451)


06 පරිච්ඡේදය


ධර්මාර්ථ විවරණයෙහි ලා අර්ථ ව්‍යාඛ්‍යානයන්හි විශ්වසනීයත්වය (452-619 ඡේද) 317-400

I. දීඝනිකාය පාළිය හා එම අට්ඨකථාව අතර දක්නට ඇති වෙනස්කම් (452-490)

II. මාගධියෙහි දී තිබෙන කරුණුවලට වඩා එකතු වී ඇති අලුත් කරුණු (491-510)

III. දේසනාපාළියෙන් බැහැර උදාහරණ කථා ගෙන හැර දක්වීම (511-532)

IV. දේසනාපාළියේ නො එන උපමා මගින් කරුණු දක්වීම (533-548)

V. දීඝනිකාය පාළියේ නො එන ගාථා මගින් විවරණ දක්වීම (549-573)

VI. පුද්ගල නාමයන්ට අදාළ පුරාවෘත්ත ගෙන හැර දක්වීම (574-578)

VII. පෙළෙහි දී තිබෙන කරුණු අට්ඨකථාවේ විශාල කොට දක්වීම (579-583)

VIII. ධර්මාර්ථ විවරණයෙහි ලා අර්ථ ව්‍යාඛ්‍යානකරු දක්වා ඇති උපහාසාත්මක කථා (584-590)

IX. භාණකවරුන් අතර පැවති මතභේද
ඇතුළත් කිරීම (591-600)

X. පෙළ හා අට්ඨකථාවේ පාඨාන්තරයන්හි
පවතින අපපාඨ හා සදොස් පාඨ (601-619)

**නිගමනය** **(620 - 629 ඡේද)** **401-403**

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** **404-415**

**වගුව I** **416**

**වගුව II** **417**